# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2435/04 - 2025 මැයි මස 06 වැනි අඟහරුවාදා - 2025.05.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

4 වන සංශෝධනය

2015 සැප්තැම්බර් මස 01 වැනි දිනැති අංක 1930/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 අප්‍රේල් මස 23 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 01 - 2016 නොවැම්බර් මස 29 වැනි දින හා අංක 1995/10 *අති විශෙෂ ගැසට්* පත්‍රය.
සංශෝධන අංක 02 - 2018 ජුනි මස 25 වැනි දින හා අංක 2077/13 *අති විශෙෂ ගැසට්* පත්‍රය.
සංශෝධන අංක 03 - 2021 නොවැම්බර් මස 26 වැනි දින හා අංක 2255/56 *අති විශෙෂ ගැසට්* පත්‍රය.

1A - G 44298 — 05 (2025/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II කොටස**

**08. කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තු පරීක්ෂණ**

**8.4** *දෙපාර්තමේන්තු පරීක්ෂණ*

I. එක් එක් තනතුරට අදාළ දෙපාර්තමේන්තු පරීක්ෂණය සම්බන්ධව වන විස්තර එම තනතුරට අදාළ බඳවා ගැනීම් පටිපාටියට ඇතුළත් කළ යුතු ය.

II. ඒ ඒ දෙපාර්තමේන්තු පරීක්ෂණ අදාළ දෙපාර්තමේන්තුව විසින් පැවැත්විය යුතු අතර, අවම වශයෙන් තාක්ෂණික විෂයන් දෙකක් සහ දෙපාර්තමේන්තු රීති හා රෙගුලාසි, පනත් ක්‍රියා පිළිවෙත්වලට අදාළ විෂයකින් සමන්විත විය යුතු ය. සියලු දෙපාර්තමේන්තු පරීක්ෂණ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ විය යුතු අතර සෑම විෂයක් සඳහාම පැය 3කට නොඅඩු ලිඛිත ප්‍රශ්න පත්‍රයක් ලබාදිය යුතු ය. ප්‍රායෝගික පරීක්ෂණයට අදාළ කාල සීමාවන් ඒ ඒ දෙපාර්තමේන්තු විසින් තීරණය කළ යුතු ය.

III. සෑම නිලධාරියකුම දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත්වීම සඳහා පළමු හා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණ දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්පූර්ණ කළ යුතු ය. දෙපාර්තමේන්තු පරීක්ෂණයේ තාක්ෂණික විෂයන්ට අදාළ සෑම ප්‍රශ්න පත්‍රයකටම අවම වශයෙන් 40% ක් ලබාගත යුතු අතර එම විෂයන්ට අදාළ මුළු ලකුණුවල සාමාන්‍ය 50% හෝ ඊට වැඩි විය යුතු ය. දෙපාර්තමේන්තු රෙගුලාසිවලට අදාළ විෂයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් 50%ක් ලබාගත යුතු ය.

IV. 7.2.1.3. (ආ) හි සඳහන් තනතුරට අදාළ තාක්ෂණික සුදුසුකමක් ලබා සිටින නිලධාරියකු දෙපාර්තමේන්තු පරීක්ෂණයේ තාක්ෂණික විෂයයන්වලින් නිදහස් කරනු ලැබේ. එවැනි නිලධාරියකු දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත්වීම සඳහා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට අදාළ විෂයෙන් සමත්විය යුතු ය.

10.1.2 *දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත්වීම අනුව*

10.1.2.1 *සපුරාලිය යුතු සුදුසුකම්*

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන තිබීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

IV. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.

V. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

VI. පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් වී තිබීම.

10.1.2.2 *උසස් කිරීමේ ක්‍රමය*

1. වසර තුනක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කළ සෑම නිලධාරියෙකුටම පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක.

2. ඉහත 1හි සඳහන් අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමෙන් පසු පවත්වනු ලබන පළමු අනුයාත විභාග වාර දෙක තුළ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් වන නිලධාරියෙකු, ඉහත 10.1.2.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයෙහි සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

10.2.2 *දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත්වීම අනුව*

10.2.2.1 *සපුරාලිය යුතු සුදුසුකම්*

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හතර (04)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හතර (04)ක් උපයාගෙන තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

III. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

IV. දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් වී තිබීම.

10.2.2.2 *උසස් කිරීමේ ක්‍රමය*

I. II ශ්‍රේණියට උසස් වී ඇති සහ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණ සමත් වී ඇති III ශ්‍රේණියේ නිලධාරින්ට දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක.

II. ඉහත 1හි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු පවත්වනු ලබන පළමු අනුයාත විභාග වාර දෙක තුළ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් වන නිලධාරියෙකු, ඉහත 10.2.2.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**15. අන්තර්කාලීන විධිවිධාන :**

අංක 15 යටතේ දක්වා තිබූ කරුණු 15.1 ලෙස අංකනය විය යුතු ය.

15.2 මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් සඳහා පමණක් මෙම අන්තර්කාලීන විධිවිධානයන් අදාළ වේ.

15.2.1 මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව පවත්වනු ලබන පළමු විභාග වාර දෙක තුළදී පළමුවන දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වන III වන ශ්‍රේණියේ නිලධාරියෙකු මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනය හෝ ඉහත 10.1.2.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට බලාත්මක වන පරිදි II වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

15.2.2 ඉහත අනු අංක 15.2.1 හි සඳහන් පරිදි මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනයේ සිට II වන ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරියකුගේ, 10.1.2.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය හෝ 2018.06.01 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනය දක්වා වන III වන ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය උසස් කිරීමේ කාර්යයන් සඳහා පමණක්, II වන ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

15.2.3 මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව පවත්වනු ලබන පළමු විභාග වාර දෙක තුළදී දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වන II වන ශ්‍රේණියේ නිලධාරියෙකු මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනය හෝ ඉහත 10.2.2.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට බලාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

15.2.4 මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව පවත්වනු ලබන එක් එක් පරීක්ෂණයට අදාළ පළමු විභාග වාර දෙක තුළදී පළමු හා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණයන්ගෙන් සමත් වන II වන ශ්‍රේණියේ නිලධාරියෙකු මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනය හෝ ඉහත 10.2.2.1 (I) හි සඳහන් සුදුසුකම හැර එහි සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට බලාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

15.2.5 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1930/12 හා 2015.09.01 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ අංක 15.1 වගන්තිය අනුව 2018.06.01 දින දක්වා අන්තර්කාලීන විධිවිධාන බලපැවැත්වුවද දෙපාර්තමේන්තු විසින් දෙපාර්තමේන්තු පරීක්ෂණ නොපැවැත්වීම මත පමණක් එක් දෙපාර්තමේන්තු පරීක්ෂණයකටවත් පෙනී සිටීමට නොහැකි වූ නිලධරයන් සඳහා නව සේවා ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම යටතේ විභාග අවස්ථා දෙකක් ලබාදිය යුතු අතර එක් දෙපාර්තමේන්තු පරීක්ෂණයකට පමණක් පෙනී සිටීමට හැකි වූ නිලධරයන් සඳහා නව සේවා ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම යටතේ විභාග අවස්ථා එකක් පමණක් ලබාදිය යුතු ය.

EOG 05 - 0009

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

EXTRAORDINARY

අංක 2435/04 - 2025 මැයි මස 06 වැනි අඟහරුවාදා - 2025.05.06

No. 2435/04 - TUESDAY, MAY 06, 2025

**(Published by Authority)**

## PART I : SECTION (I) — GENERAL

### Government Notifications

**SERVICE MINUTE OF THE SRI LANKA TECHNOLOGICAL SERVICE**

**4th Amendment**

THE Service Minute of the Sri Lanka Technological Service published in the *Gazette Extraordinary* No. 1930/12 dated 01st September 2015 of the Democratic Socialist Republic of Sri Lanka is amended as stated in Part II below. Other matters and conditions stated therein remain unchanged.

By order of the Public Service Commission,

W. H. M. M. C. K. Dayaratne,
Secretary,
Public Service Commission.

On 23rd April, 2025.

**Part I**

Amendment No. 1 - *Gazette Extraordinary* No. 1995/10 dated 29th November 2016
Amendment No. 2 - *Gazette Extraordinary* No. 2077/13 dated 25th June 2018
Amendment No. 3 - *Gazette Extraordinary* No. 2255/56 dated 26th November 2021


*This Gazette Extraordinary can be downloaded from* www.documents.gov.lk

**Part II**

**08. Efficiency Bar Examinations and Departmental Tests :**

***8.4 Departmental Tests***

I. The details of the Departmental Test relevant to each post shall be included in the Scheme of Recruitment of the respective Post.

II. The respective Departmental Test shall be conducted by the relevant department and shall consist of at least two technical subjects and a subject related to departmental rules and regulations, acts and procedures. All Departmental examinations shall be written and practical, and each written question paper of not less than three hours in duration shall be provided for each subject. The time limits applicable for the practical tests shall be determined by the respective departments.

III. Every officer shall complete both the first and the second Departmental Tests within not more than two sittings to pass the Departmental tests. A minimum of 40% shall be obtained for each question paper relevant to the technical Subjects of the Departmental Test while the average score for those subjects shall be 50% or higher. A minimum of 50% shall be obtained to pass the subject related to departmental regulations.

IV. An officer who possesses a technical qualification relevant to the post mentioned in Section 7.2.1.3 (b) shall be exempt from the technical subjects of the departmental test. Such an officer should pass the subject relevant to the departmental regulations in order to pass the departmental test.

*10.1.2. Upon passing the departmental test*

*10.1.2.1. Qualifications to be fulfilled.*

I. Should have been confirmed in the Service.

II. Should have completed active and satisfactory period of service of at least five (05) years in Grade III of the service and earned five (05) salary increments.

III. Should not have subjected to any disciplinary punishment in terms of the Public Service Commission Circular No. 01/2020.

IV. Should have acquired proficiency in the other official language at the respective level.

V. Should have passed the first efficiency bar examination on the prescribed date

VI. Should have passed the first Departmental Test.

*10.1.2.2. Method of promotion :*

1. Each officer who has completed three years of active service shall sit for the first departmental test.

2. An officer who passes the first departmental test within the first two consecutive sittings held after fulfilling the requirement mentioned in (1) above shall be promoted to Grade II from the date on which he fulfills the qualifications specified in 10.1.2.1. above.

*10.2.2. Upon passing the departmental test*

*10.2.2.1 Qualifications to be fulfilled*

I. Should have completed a minimum of four (04) years of active and satisfactory service in Grade II of the Service and earned four (04) salary increments.

II. Should not have subjected to any disciplinary punishment in terms of the Public Service Commission Circular No. 01/2020.

III. Should have passed the second efficiency bar examination on the prescribed date.

IV. Should have passed the second Departmental Test.

*10.2.2.2. Method of promotion :*

I. Officers in Grade III who have been promoted to Grade II and have passed the first departmental test are eligible to sit for the second departmental test.

II. An officer who passes the second departmental test within the first two consecutive sittings held after fulfilling the requirements mentioned in (1) above shall be promoted to Grade I from the date on which they fulfill the qualifications mentioned in 10.2.2.1 above.

**15. Interim provisions :**

The facts mentioned under No. 15 shall be renumbered as 15.1

***15.2 These interim provisions shall apply only to the officers who are in service on the effective date of this amendment.***

15.2.1 An officer in Grade III who passes the first departmental test within the first two sittings of the tests conducted after the effective date of this amendment will be promoted to Grade II, effective from the date either from the effective date of this amendment or the date of fulfillment of the qualifications mentioned in Section 10.1.2.1, whichever occurs later.

15.2.2. The active and satisfactory service period in Grade III of an officer promoted to Grade II as specified in sub-section 15.2.1 above either from the date of fulfillment of the qualifications mentioned in 10.1.2.1. from the effective date of this amendment or from 01.06.2018, whichever occurs later, to the effective date of this amendment, shall be considered as an active and satisfactory period of service in Grade II, only for the promotional purposes.

15.2.3. An officer in Grade II who passes the second departmental test within the first two sittings conducted subsequent to the effective date of this amendment will be promoted to Grade I, effective from either the effective date of this amendment or the date on which the qualifications mentioned in section 10.2.2.1 are completed, whichever occurs later.

15.2.4. An officer in Grade II who passes the first and second departmental tests within the first two tests conducted subsequent to the effective date of this amendment will be promoted to Grade I, effective from either the effective date of this amendment or the date on which the qualifications mentioned therein, other than the qualification in section 10.2.2.1 (1) are completed, whichever occurs later.

15.2.5. In terms of the Section 15.1 of the Service Minute of the Sri Lanka Technological Service published in the *Gazette Extraordinary* No. 1930/12 dated 01.09.2015 of the Democratic Socialist Republic of Sri Lanka the interim provisions were in effect until 1st of June 2018, but the officers who were unable to sit any of the departmental tests due to the departments not conducting departmental tests shall grant two attempts under the implementation of the new amendments of service minute and the officers who were unable to sit one of the departmental tests shall grant one opportunity under the implementation of the new amendments of the service minute.

EOG 05 - 0009

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA.